**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - 2021**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලයඅඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේඅඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරිමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරවකාර්යාලයේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>--------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| (අ) 2021 මාර්තු මාසයේදී අධිකරණ අමාත්‍යාංශය වෙතින් පවරා දෙන ලද පිරිවැය රු. 2,600,000 ක් වූ මෝටර් රථය ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී අයිතිය පවරාගත් වාහනයේ වටිනාකම ගිණුම්ගත කරන බව කාරුණිකව දන්වමි. | වත්කම් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) ඉකුත් වර්ෂයේදි කාර්යාල බෙදා වෙන් කිරිමේ වියදම වූ රු.798,639 ක් ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර තිබුණද, 2022 සැප්තැම්බර් මාසයේදි ගොඩනැගිල්ලෙන් ඉවත්වීමට සිදුවන බැවින් ක්ෂය කරනු ලබන සියයට 5 ප්‍රතිශතය ප්‍රමාණවත් නොවන බව නිරික්ෂණය විය. | 2022 වර්ෂයේ ගිණුම් වල සුදුසු පරිදි ගැලපීම් සිදු කරමි.<br>. | වත්කම්වල ක්ෂය වියදම ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල හඳුනාගත යුතුය. |

## 1.6 නිති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තිරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තිරණ ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2017 පෙබරවාරි 28 දිනැති අංක 04/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව පුහුණුලාභීන්ට දෛනිකව රු. 500 ක දීමනාවක් ගෙවිය යුතු වුවද, ඊට පටහැනිව දෛනිකව රු. 1,000 බැගින් නිළධාරීන් 18 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් රු.283,418 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩල බඳවා ගැනීම සඳහා වැටුප් වෙනුවෙන් ලැබිය යුතු ප්‍රතිපාදන නොලැබීම නිසා විකල්පයක් ලෙස රාජකාරි කටයුතු ඉටු කරවා ගැනීම සඳහා පුහුණුලාභීන් යොදා ගෙන ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ)2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය | කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත්කල යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වග බලා ගන්නා ලෙසට නිලධාරින් දැනුවත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,466,061 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේඅතිරික්තය රු. 3,052,909 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,518,970 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්තන ලැබීම්වල රු. 4,495,444 ක අඩුවීම හා සේවා වියදම් රු. 5,160,711 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අතුරුදහන්වූවන්ට අදාලව පැමිණිලි 39,473 ක් ලැබී තිබුණද, මෙතෙක් නිකුත් කරන ලද අතුරු වාර්තා ප්‍රමාණය 67 ක් පමණක් විය. තවද, ලැබී තිබුණු පැමිණිලිවලට අදාලව ගොණු 21,171 ක් පමණක් විවෘත කර තිබුණු අතර විමසීම් සඳහා කැඳවන ලද පවුල් සංඛ්‍යාව 702 ක් වුයෙන් ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස සියයට 3.32 ක් වැනි ඉතා අඩු අගයක් විය. | පැමිණිලි සඳහා පවත්වන පරික්ෂණ ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණින් 2022 ජනවාරි මස සිට උතුරු පළාතේ විමර්ශන කටයුතු ආරම්භකර ඇත. | අතුරුදන්වූවන්ට අදාල පැමිණිලි සම්බන්ධව කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ)2021 දෙසැම්බර් 31 දිනට සේවකයන් 33 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් සහිතව කාර්යාලය පවත්වාගෙන යාම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 67,196,544 පිරිවැයක් දරා තිබුණද, පනතේ දැක්වෙන කාර්යයන් හා අනෙකුත් කාර්යයන් ඉටුකර ගැනීම වෙනුවෙන් සැලසුම් සකස් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2016 අංක 14 දරනඅතුරුදහන් වු තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ පනතේ 11 කොටසේ 10 (ආ) වගන්තිය ප්‍රකාරව අතුරුදහන් වු තැනැත්තන් සම්බන්ධ සිදුවීම් පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල බලධාරීන් වෙත නිර්දේශ සිදුකිරීම, 10 (ඇ) වගන්තිය ප්‍රකාරව පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අතුරුදහන් වු තැනැත්තන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා බැඳියා ආරක්ෂා කිරීම සිදුකිරීම සහ පනතේ II කොටසේ 10 (1) හි දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීමට අදාළ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා උචිත යාන්ත්‍රණයක් පිහිටුවීමට සහ කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයේ පැවැති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශිය කාර්යාල වලින් අපේක්ෂිත කාර්යයන් ඉටුකරවා ගැනීමට නොහැකි විය.<br>2022 වර්ෂයේ සිට ප්‍රාදේශීය කාර්යාල වෙත වැඩි වගකීමක් පවරමින් අපේක්ෂිත කාර්ය ඉටුකරවා ගැනීමට කටයුතු කර ඇත. | කාර්යාලය පිහිටුවීමේ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කලයුතුය. |

**4. මානව සම්පත් කලමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රධාන කාර්යාලයට අමතරව පළාත් කාර්යාල 4 ක් පවත්වාගෙන යනු ලබන අතර ඒවායේ පළාත් සම්බන්ධීකාරකවරු 4 ක් ඇතුළුව නිලධාරින් 13 දෙනෙක් සේවය කරනු ලබයි. ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී වැටුප් වශයෙන් රු.7,442,045 ක්ද, ගොඩනැගිලි කුලී, විදුලි හා ජල බිල්පත් , ආරක්ෂක සේවා හා පිරිසිදුකිරීමේ ගාස්තු වශයෙන් රු. 8,528,764 ක මුදලක් ගෙවීම් කර තිබුණි. එසේ වුවත්, ඔවුන් වෙත කාර්යය පැවරුම් සිදුකර එකී කාර්යයන් ඔවුන් විසින් ඉටුකරනු ලබන්නේද යන්න ඇගයීමක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේ පැවැති කොරෝනා වසංගත තත්ත්වය නිසා අපේක්ෂිත පරිදි ප්‍රාදේශිය කාර්යාල වලින් රාජකාරි ඉටුකරවා ගැනීම අපහසු විය.කෙසේ වෙතත් ඉදිරියේදි ප්‍රාදේශිය සම්බන්ධීකාරකවරුන් වෙත නිශ්චිත රාජකාරි පවරා අධීක්ෂණය කිරීමට කටයුතු කරමි. | නිලධාරින් හටකාර්යය පැවරුම් සිදුකර එකී කාර්යයන් ඉටුකරනු ලබන්නේද යන්න ඇගයීමක් සිදුකලයුතුය. |